# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/5 - 2011 ජූලි 11 වැනි සඳුදා - 2011.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : T23/P/105/2003.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරිය**

131 වැනි අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2005.10.27 දිනැති හා අංක 1416/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2005.10.18 වැනි දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන් ඉඹුල්ගස්දෙණිය, මොරගොල්ල, අංක 04හි ජී. බී. වීරසූරිය මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 27හි පිහිටි සමූපකාර තොග වෙළඳ සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2011.05.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 ජුනි මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : T23/P/105/2003.

එක් පාර්ශවයක් වශයෙන්,

ජී. බී. වීරසූරිය මයා,
අංක 04,
මොරගොල්ල,
ඉඹුල්ගස්දෙණිය.



ඉල්ලුම්කරු

නඩු අංකය : ඒ 3141

හා

අනෙක් පාර්ශවය වශයෙන්,

සමූපකාර තොග වෙළඳ සංස්ථාව,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02

වගඋත්තරකරු

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳවයි.

ප්‍රදානය

එකී ආරාවුල කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න මහතා, 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දර කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන දරන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කරනු ලැබ එකී ආරාවුල 2005.10.18 වැනි දිනැති ලිපිය මගින් මා වෙත යොමු කරනු ලැබීය.

2005.10.07 වැනි දිනැති ලිපය මගින් කම්කරු කොමසාරිස්වරයා විසින් එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය පහත දැක්වෙන අයුරින් නියම කර ඇත.

"සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ කුරුණෑගල ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමණාකරු වශයෙන් සේවය කළ ජී. බී. වීරසූරිය මහතාට 1999.01.06 දිනැති අංක එෆ්. ඩී/01/99 දරන එම සංස්ථා චක්‍රලේඛය මගින් හඳුන්වා දෙනු ලැබූ දිරි දීමනා ක්‍රමය අනුව 1999.09.01 දින සිට 2000.10.29 දින දක්වා වූ කාලසීමාව සඳහා දිරි දීමනා ලබා නොදීම යුක්තිසහගත ද යන්න හා නොඑසේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව ද වේ."

මෙම නඩුව මුල් අවස්ථාවේ කැඳවූ විට දෙපාර්ශවයම ඊට පෙනී සිටි අතර ඉල්ලුම්කරු වන ජී. බී. වීරසූරිය යන අය නියෝජිතයෙකු මාර්ගයෙන් පෙනී සිටියේ ය. පසුව ඉල්ලුම්කරු මිය ගිය අතර ඔහුගේ නීත්‍යානුකූල යැපෙන්නන් වන පහත සඳහන් අය නඩුවට ඉදිරිපත් විය.

(1) අම්පේ මොහොට්ටිගේ මැටිල්ඩා අබේගුණවර්ධන
(2) වීරසූරිය ආරච්චිලාගේ මංජුලා සුභාෂිණී වීරසූරිය
(3) වීරසූරිය ආරච්චිලාගේ චන්දිමා ප්‍රියානි වීරසූරිය
(4) වීරසූරිය ආරච්චිලාගේ අසංග සම්පත් වීරසූරිය

මෙහිදී අංක 01, 02 හා 03 නම් සඳහන් අය අංක 04හි නම් සඳහන් වීරසූරිය ආරච්චිලාගේ අසංග සම්පත් වීරසූරිය යන අයට 2006.06.24 වැනි දින දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් මෙම ආරවුලට පෙනී සිටීමට හා අවසානයේ ලැබෙන ප්‍රතිලාභ ලබාගැනීමට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කොට ඇත.

ඉන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවය විසින් මූලික විරෝධතා ඉදිරිපත් කර ඇති අතර ඊට ඉල්ලුම්කාර පාර්ශවය විසින් ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රතිවිරෝධතා ප්‍රකාශයේ මූලිකම කරුණ වන්නේ 1949 අංක 47 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථාව පනත හා එහි සංශෝධන ප්‍රකාරව, සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නමින් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට යටත් විය යුතු බවය. එය විරෝධතා ප්‍රකාශයේ XI(අ) සහ XI(ආ) යන ලේඛන වල සඳහන් වේ.

බේරුම්කරණය සඳහා බේරුම්කරුවෙකු ඉදිරියට යම් ආරවුලක් යොමු කළ විට එම යොමුවට අදාලව කටයුතු කිරීමට බැඳී සිටින අතර එම යොමුවේ යම් වෙනසක් සිදු කළ යුත්තේ විෂය භාර අමාත්‍යවරයා විසිනි.

මෙම ආරවුලට අදාල යොමුවේ පාර්ශවකරුවකු ලෙස නම් කර ඇති සමූපකාර තොග වෙළඳ සංස්ථාව යන නමින් මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට නීතිමය හැකියාවක් සමූපකාර තොග වෙළඳ සංස්ථා පනත යටතේ නොමැති අතර වගඋත්තරකාර පාර්ශවය වෙතින් ගොනු කර ඇති මූලික විරෝධතාවය සලකා බලා මෙම නඩුව මෙයින් නිශ්ප්‍රභා කරමි.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් ලෙස ද වැඩිදුරටත් නියම කර සිටී.

බේරුම්කරු,
එන්. සී. වී. කුලතුංග.

2011 මැයි මස 30 වැනි දින.

07-625

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.